# 5. අවට ජීවත්වන්නන්ගේ ආදරය

එදා සුරේෂ් අයියාගේ උපන් දිනය.

අයියාගේ පාසලේ යාළුවෝ හුඟ දෙනෙක් අපේ ගෙදර ඇවිත් සිටියා.

යොහාන් කතෝලිකයෙක්. සමන් බෞද්ධ

කුමාර් හින්දු, අමීර් ඉස්ලාම්.

ජාතිය, ආගම, වෙනස් වුණාට මේ ඔක්කෝ ම යාළුවෝ.

එක ම පවුලේ සහෝදරයෝ වාගේ

මේ යාළුවෝ දැකලා, එදා අපේ තාත්තා කීවා

මිනිස්සු ආගම් ජාති වශයෙන් වෙනස් වෙලා සිටියත් අපි සැම දෙනා ම එක ම දෙවිපියාණන්ගේ දරුවෝ කියලා

ඒක නම් ඇත්ත ම ඇත්ත.

උපන් දින උත්සවයට පැමිණි දේවගැති තුමා ඒ යාළුවෝ සියලු දෙනා ම ගැන යාච්ඤා කළා.

අපි සියලු දෙනා ම සුරේෂ් අයියාට සුබ පතා උපන් දින ගීතය ගායනා කළා.



සුබ උපන් දිනක් වේවා! //
ස්රේෂ් අයියාට දෙව්සිරියෙන් පිරි
උපන් දිනක් වේවා!

උස මහතත් සමගින්
කරුණා ගුණ වඩමින්
සැමට ම ප්‍රිය වූ දෙව්
දරුවකු ලෙස යහමග
ගමන් කරන්.

## පැවරුම්

1. උපන් දින උත්සවයට සහභාගි වූ ළමුන්ගේ නම් හා ආගම් ලියන්න.

2. උපන් දිනයේ දී සියලු දෙනා වෙනුවෙන් යාච්ඤා කළේ කවුද?

3. පන්තියේ උපන් දින අවස්ථාවක දී ගායනා කිරීමට මේ ගීතය කට පාඩම් කරන්න.